# මහනුවර යුගයේ අධ්‍යාපනයේ ස්වභාවය

සෙනවිරත්න බණ්ඩාර

## ප්‍රවේශය

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයට දිගු ඉතිහාසයක් ඇත. එම අධ්‍යාපන ඉතිහාසය විස්තර කිරීමේදී ඒ ඒ යුගවල සිදු වූ වෙනස්කම්, ප්‍රගතිය, අධ්‍යාපන පරිපාලනය, විෂය මාලාව, ගුරුවරුන්, අධ්‍යාපන ආයතන ආදිය පිළිබඳව වෙන වෙනම විස්තර කරනු ලබයි. මෙහිදී ඒ ඒ යුගවල සමස්ථ අධ්‍යාපනයම පිළිබඳව විස්තර කර පසුව මහනුවර යුගයේ අධ්‍යාපනය පිළිබඳව තුලනාත්මකව විග්‍රහ කිරීමක් සිදු කරන ලදි.

## විමර්ශනය

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසය සලකන විට එය විජයාවතරණයට පෙර ප්‍රාග් ඓතිහාසික යුගය (ක්‍රි.පූ. 543 ට පෙර යුගය) දක්වා හඳුනාගත හැකිය. අධ්‍යාපන ඉතිහාසය සැලකීමේදී පහසුව සඳහා යුගයන් කිහිපයකට බෙදා ඒ එක් එක් යුගයේ අධ්‍යාපනය විස්තර කරනු ලබයි.

1. විජයාවතරණයට පෙර යුගය ( ප්‍රාග් ඓතිහාසික යුගය)
2. විජයාවතරණයේ (ක්‍රි.පූ. 543) සිට මහින්දාගමනය දක්වා යුගය (දේවානම්පියතිස්ස රාජ්‍ය සමය ක්‍රි.පූ. 253-213)
3. මහින්දාගමනයෙන් පසු පෘතුග්‍රීසි ආක්‍රමණය (ක්‍රි.ව. 1505) දක්වා යුගය
4. පෘතුග්‍රීසි යුගය (ක්‍රි.ව.1505 - ක්‍රි.ව. 1656)
5. ලන්දේසි යුගය ( ක්‍රි.ව. 1656 - ක්‍රි.ව. 1796)
6. ඉංග්‍රීසි (බ්‍රිතාන්‍ය) යුගය ( ක්‍රි.ව. 1796 - ක්‍රි.ව. 1948)
7. නිදහසින් පසු යුගය (ක්‍රි.ව. 1948 න් පසුව)

මෙම යුගවල අධ්‍යාපනය පිළිබඳව විමර්ශණය කිරීමේදී මහනුවර යුගය අයත් වන කාල පරාසය අනුව, ඉහත සඳහන් අධ්‍යාපන ඉතිහාසයට අයත් වන යුගයන් වෙන්කර ගෙන අධ්‍යයනය කළ යුතුය. හේතුව වන්නේ ඉහත සඳහන් පරිදි අධ්‍යාපන ඉතිහාසයේ යුගයන් වෙන් කරගෙන තිබෙන්නේ ශ්‍රී ලංකාවේ රාජධානි අනුව නොවන බැවිණි. මහින්දාගමනයෙන් පසුව ඉංග්‍රීසින් ක්‍රි.ව. 1815 දී මහනුවර රාජධානිය අල්ලාගන්නා තෙක් අධ්‍යාපන ඉතිහාසය මහනුවර යුගයට සම්බන්ධකර විස්තර කළ හැකිය.

මහනුවර යුගයේ අධ්‍යාපනය පිළිබඳ විමර්ශණය කිරීමේදී ප්‍රධාන ක්ෂේත්‍ර දෙකක් පිළිබඳව අවධානය යොමු කිරීමට සිදු වේ. එනම් මහනුවර යුගය පිළිබඳව හා එකල පැවති අධ්‍යාපනය පිළිබඳවයි. මහනුවර යුගයට අයත් කාල පරිච්ඡේදය නිවැරදිව නිශ්චය කොට නැතත් 17 වැනි හා 18 වැනි සියවස් මීට අයත් කරගත හැකිය. මහනුවර යුගය අවසන් වන්නේ බ්‍රිතාන්‍යයන් විවිධ ආකාරයෙන් ශ්‍රී ලාංකිකයන් සමඟ සටන් වදිමින් අවසානයේදී 1815 දී විදේශිකයන්ට ආක්‍රමණය කිරීමට නොහැකි වූ උඩරට රාජධානිය ගිවිසුමක් මගින්ම අත්පත් කර ගැනීමෙන් පසුවයි. මහනුවර යුගයට අයත් ප්‍රදේශය සලකන විට තල්වත්ත

(2015) ප්‍රකාශ කරන්නේ සත් කෝරලය, ඌව, වලපනේ, උඩපලාත, නුවරකලාවිය, මාතලේ, සබරගමුව, තුන් කෝරලය, වෙල්ලස්ස, බිම්තැන්න, තමන්කඩුව, උඩු නුවර, යටි නුවර, හේවාහැට, උඩුබුලත්ගම, කොත්මලේ, හාරිස්පත්තුව, උඩුදුම්බර හා පාතදුම්බර යන ප්‍රදේශයන්ය. මහනුවර රාජධානිය ස්වාභාවිකව පිහිටි කඳු, ගිරි දුර්ග, වලින් ආරක්ෂිත වූ ප්‍රදේශයක් නිසා සතුරු ආක්‍රමණවලින් ආරක්ෂා කරගැනීම පහසු විය. මේ නිසා සියවස් ගණනාවක් අනෙකුත් ප්‍රදේශ වලින් හුදෙකලාව බලපෑම් වලින් තොරව රාජධානිය අනන්‍ය ආකාරයෙන් පවත්වාගෙන යාමට හැකි විය. මේ නිසාම යම් තරමක ස්වාධීන වූ හා අනන්‍ය වූ අධ්‍යාපන පද්ධතියක් හා ක්‍රියාවලියක් එම යුගය තුළ පැවති බවට සාධක ඇත.

මීළඟට ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසය පිළිබඳව සලකා බලමු. මුලින් සඳහන් කළ ආකාරයට යුගයන් හතක් ඔස්සේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසය විස්තර කළ හැකිය. මෙම යුගයන් පිළිබඳ සැලකිලිමත් වීමේදී විජයාවතරණයට පෙර ශ්‍රී ලංකාවේ ස්වදේශිකයන් විවිධ ඇදහීම්, පුද පූජා, පවත්වා ඇති බව පෙනී යයි. සෑම විටම මෙම යුගයේ ඉන්දියානු බලපෑම් නිසා අධ්‍යාපනයට මෙන්ම ජන ජීවිතයට ඉන්දියානු ආභාෂය ලැබෙන්නට ඇත. මෙම යුගයේ අධ්‍යාපනය පිළිබඳ ලිඛිත හා පුරාවිද්‍යා සාක්ෂි නැති අතර පුරාවෘත්ත තුළින් යම් තරමක දියුණු අධ්‍යාපනයක් තිබූ බව සිතිය හැකිය. ඓතිහාසික රාම - රාවණා ප්‍රේම වෘත්තාන්තය ක්‍රි.පූ. 1810 දී සිදු වී ඇති බවට විශ්වාසයක් පවතී. පුරාවෘත්ත වල සඳහන් වන ආකාරයට විජය කුමාරයා ලංකාවට පැමිණෙන විට ස්වදේශීය කාන්තාවක් වන කුවේණී කපු කටිමින් සිටි බව පැවසේ. එනම් රෙදිපිළි කර්මාන්තය පිළිබඳ අධ්‍යාපනයක් තිබී ඇත.

මීළඟ යුගය වන්නේ විජයාවතරණයෙන් පසු මහින්දාගමනය තෙක් යුගයයි. මෙම යුගයේදී පැරණි භාරතයේ මෙන්ම ගුරුගෙදර අධ්‍යාපන ක්‍රමය ශ්‍රී ලංකාවේ පැවති බවට සාධක ඇත. මෙම යුගයේ අධ්‍යාපනයේ ආධිපත්‍ය දැරුවේ බමුණන් විසිනි. බමුණන් රජුට උපදෙස් දෙමින් විවිධ වේදයන් පිළිබඳ අධ්‍යාපනය ප්‍රභූ පන්තියට ලබාදෙන ලදී. විජය රජු සමඟ ශ්‍රී ලංකාවට බමුණන් පැමිණ ඇත. විජය රජුගේ පුරෝහිත වූයේ උපතිස්ස නැමති බ්‍රාහ්මණයෙකි. පණ්ඩුකාභයට අකුරු ඉගැන්වූයේ පණ්ඩුල නැමති බමුණාය. පණ්ඩුකාභයගේ පුරෝහිත වූයේ පණ්ඩුලගේ පුතා වූ චන්ද්‍ර නැමති බමුණාය. මේ අනුව බමුණන් රජවරුන් සමඟ සමීපව රාජ්‍ය පාලනයට මෙන්ම අධ්‍යාපනයටද සම්බන්ධ වූ බව පෙනී යයි. ඊට අමතරව සමාජීය තත්ත්වය සලකන විට වැඩවසම් සමාජ ක්‍රමය පැවතිනි. එහිදී ප්‍රධාන කුලයන් තිබුණු අතර ඒ ඒ ජන වර්ගයට පැවරුන කර්මාන්ත තිබුණු අතර ඒ සඳහා පරම්පරාවෙන් පරම්පරාවට කර්මාන්ත හා ශිල්ප පිළිබඳ අධ්‍යාපනය ලැබීම සිදු වී ඇත.

මීළඟට ආරම්භ වන්නේ මහින්දාගමනයෙන් පසුව ඇති වූ අධ්‍යපන යුගයයි. එය මහින්දාගමනයෙන් පසු පෘතුග්‍රීසීන් (ක්‍රි.ව. 1505) ලංකාව ආක්‍රමණය තෙක් පවතින දිගු කාල පරිච්ඡේදයකි. මෙම යුගය අධ්‍යාපනයේ පමණක් නොව, ශ්‍රී ලංකා ඉතිහාසයේම ස්වර්ණමය යුගය ලෙස සැලකිය හැකිය. බෞද්ධාගමින් පෝෂිත වූ බෞද්ධ අධ්‍යාපන පද්ධතියක් මෙම කාලය තුළ රටේ ක්‍රියාත්මක වී ඇත. මහින්දාගමනයෙන් පසුව සිදුවූ ප්‍රධානම අධ්‍යාපනික වෙනසක් ලෙස එතෙක් ලංකාවේ පැවැති අසංවිධිත ගුරු ගෙදර අධ්‍යාපන සම්ප්‍රදාය ක්‍රමයෙන් අහෝසි වී බෞද්ධ භික්ෂුව ප්‍රමුඛ වූ බෞද්ධ අධ්‍යාපන පද්ධතියක් බිහිවීම හඳුන්වා දිය හැකිය. මීට පෙර අවධියේ අධ්‍යාපනයේ මුර දේවතාවුන් වූයේ බ්‍රාහ්මණයන්ය. පසුව එම අධිකාරිත්වය බෞද්ධ භික්ෂුවට හිමි විය. මුලින් භික්ෂූන් වහන්සේලාට පමණක් අධ්‍යාපනය ලැබුණ අතර පසුව ගිහියන්ටද අධ්‍යාපන අවස්ථාව හිමිවිය. තවද බමුණන් සතුව තිබූණු රජුට අවවාද අනුශාසනා කිරීමේ පුරෝහිත තනතුර හා අධ්‍යාපන ඒකාධිකාරිත්වය සම්පූර්ණයෙන් බෞද්ධ භික්ෂුවට ලැබුණි.

බෞද්ධ අධ්‍යාපනයේදී මූලික (ප්‍රාථමික) අධ්‍යාපනය ලබාදීම ගමේ පන්සල මගින් ද ද්විතීක අධ්‍යාපනය පිරිවෙන මගින් ද තෘතියික අධ්‍යාපනය ලබාදීම මහා විහාරය මගින් ද සිදුවිය. උදාහරණ ලෙස අනුරාධපුර මහා විහාරය, අභයගිරිය, ජේතවනාරාමය ආදිය දැක්විය හැක. මේ ආයතන වර්තමානය හා සසඳන විට පන්සල ගමේ ප්‍රාථමික පාසලටද, පිරිවෙන - වර්තමාන ද්විතීක පාසලටද, මහා විහාරය - තෘතීයික අධ්‍යාපන ආයතන වන විශ්ව විද්‍යාලවලටද සමාන කල හැකිය. වසර එක් දහස් පන්සියකට අධික කාලයක් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ මෙම බෞද්ධ අධ්‍යාපන ක්‍රමය තුළින් ශ්‍රී ලංකාව ලෝකයේ ශ්‍රේෂ්ඨත්වයට පත්විය. විශේෂයෙන් මෙහි ස්වර්ණමය අවධිය වන්නේ අනුරාධපුර හා පොළොන්නරුව යුගයන්ය. එම අවධිවල කෘෂිකර්මය, වාරි කර්මාන්තය, පරාම්පරික වෛද්‍ය විද්‍යාව

විවිධ කලා ශිල්ප, පරිසර කළමනාකරණය වැනි ක්ෂේත්‍රවල ඉතා දියුණුවක් තිබූ බව දැනට ඉතිරිව ඇති නටබුන් තුලින්ද පැහැදිලි වේ. මේ අනුව පැහැදිලි වන්නේ මහින්දාගමනයෙන් පසු බුදු දහමින් පෝෂණය වූ පන්සල මුල්කර ගත් බෞද්ධ අධ්‍යාපන පද්ධතියක් ලංකාවේ බිහිවූ බව සහ දීර්ඝ කාලයක් තිස්සේ පෝෂණය වූ නිසා එය ඉතා ඉහළ සංවර්ධනයක් කරා ළඟා වූ බවයි. මෙම බෞද්ධ අධ්‍යාපන පද්ධතියට පොළොන්නරුව යුගයේදී විවිධ භාරතීය හා වෙනත් බලපෑම් එල්ල විය. ඒ අනුව හින්දු හා ඉස්ලාම් ආගමික කොටස්ද අධ්‍යාපන පද්ධතියට එක්වීම සිදුවිය.

පසුව දඹදෙණිය යුගය තුළ කාලිංග මාඝගේ ආක්‍රමණයෙන් විනාශ වී ගිය පිරිවෙන් දෙවන පැරකුම්බා හා තුන්වන විජයබා රජවරුන් විසින් අලුත්වැඩියා කර ස්වදේශීය අධ්‍යාපනයට නව පනක් ලබා දී ඇත. ඒ අනුව පූජාවලිය, සද්ධර්මරත්නාවලිය, අත්තනගලු වංශය වැනි බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ බිහිවිය. දඹදෙණි යුගයේ අධ්‍යාපන ආයතන වන මහා මහින්ද පිරිවෙන, බුවනෙකබා පිරිවෙන, පැරකුම්බා පිරිවෙන, මයුරපාද පිරිවෙන වැනි අධ්‍යාපන ආයතන. කෝට්ටේ යුගයේදී බෞද්ධ අධ්‍යාපන ආයතන සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි විය. මෙම යුගයේ මෙම අධ්‍යාපන ආයතන මූලායතන ලෙස හැඳින්විය. උදාහරණ ලෙස උත්තර මූලය, දක්ෂිණ මූලය, කප්පරමූලය, වගදීපක මූලය, සෙල්ලක්කර මූලය, සරෝගාම මූලය, මහනේත්‍රප්‍රසාද මූලය ආදිය හඳුන්වා දිය හැක. තවද මෙකල ප්‍රසිද්ධ වූ පිරිවෙන් කිහිපයක් සලකා බලන විටද පෙනීයන්නේ රටේ අගනුවර වන කෝට්ටේ ප්‍රදේශය කේන්ද්‍රකොට එම ආයතන පැවැති බවයි. උදාහරණ ලෙස තොටගමුවේ විජයබා පිරිවෙන, වීදාගම සනානන්ද පිරිවෙන, කැරගල පද්මාවතී පිරිවෙන, පැපිලියානේ සුනේත්‍රා දේවි පිරිවෙන ආදිය දැක්විය හැකිය. තවද ක්‍රි.ව. 1500 පමණ වන විට යම් ආකාරයක ස්වදේශී අධ්‍යාපනයේ දියුණුවක් ඇති විය.

පෘතුග්‍රීසි ආක්‍රමණයෙන් පසුව ඔවුහු රටේ මුහුදුබඩ ප්‍රදේශ වසර 150 කට ආසන්න කාලයක් පාලනය කළෝය. පෘතුගීසීන්ගෙන් පසුව ලන්දේසීන් හා ඉංග්‍රීසීන් මෙම රටේ මුහුදුබඩ ප්‍රදේශ ඇතුළුව උඩරට රාජධානිය හැර අනෙක් ප්‍රදේශ පාලනය කරන ලදී. ක්‍රි.ව. 1505 සිට ක්‍රි.ව. 1656 තෙක් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පාලනය කරන පෘතුගීසින් හා එම ප්‍රදේශවල ඔවුන්ගේ අධ්‍යාපනයත් ගෙන බලන විට එහි පරමාර්ථ වූයේ,

1. ස්වදේශිකයන් රෝමානු කතෝලික ආගමට හරවා ගැනීම.
2. තම ආගම පිළිගත් පිරිස වැඩිවීම තුලින් තමාගේ වෙළඳ කටයුතු වලට ලැබෙන සහාය වර්ධනය කරගැනීම.
3. තමා පාලනය කළ ප්‍රදේශය තුල වැසියන්ගේ අවනතභාවය ආගම තුලින් ලබාගැනීම.
4. රෝමානු කතෝලික ආගම වැළඳගත් අයට කියවීම, ලිවීම, අංකය ගණනය ආදි විෂයයන් ගැන අධ්‍යාපනයක් ලබාදීම.

මොවුන් ඉහත අධ්‍යාපන පරමාර්ථ ඉෂ්ඨ කරගැනීමට අධ්‍යාපනයේ වගකීම පල්ලියට පවරන ලදී. ඒ මගින් ප්‍රදේශවල අධ්‍යාපනය පැතිරවීමේ කාර්ය මිෂනාරී නිකායන්ට පවරන ලදී. ඔවුන් පල්ලිය කේන්ද්‍රකරගත් පාසල් අරඹන ලදී. ශ්‍රී ලංකාවේ මුලින්ම වර්තමානයේ පවතින පාසල (School/College) නැමැති ආයතන මේ ආකාරයට බිහිවිය. මේ ආකාරයට පාසල් ආරම්භකර විධිමත් අධ්‍යාපනය කෝට්ටේ, කොළඹ, යාපනය, හලාවත, හේවාගම් කෝරළේ මාතර, හත් කෝරළය, හතර කෝරළය, සබරගමුව, රත්නපුර ආදි ප්‍රදේශවල ජනතාවට ලබාදෙන ලදී.

ක්‍රි.ව. 1656 පෘතුග්‍රීසීන් සතුව පැවැති ප්‍රදේශ 11 වන රාජසිංහ රජුගේ ඉල්ලීම නිසා පැමිණි ලන්දේසීන් අල්ලා ගන්නා ලදී. පසුව ඔවුන් තම ප්‍රදේශයන්, කොළඹ, ගාල්ල හා යාපනය ලෙස පාලන ප්‍රදේශ 3 කට බෙදා පාලනය කරන ලදී. මොවුන් මහජන සහාය උපරිම ලෙස ලබා ගැනීම සඳහා සුභ සාධන සේවාවක් ලෙස අධ්‍යාපනය පවත්වාගෙන යන ලදී.

## ලන්දේසීන්ගේ අධ්‍යාපන පරමාර්ථ

- ක්‍රිස්තියානි (රෙපරමාදු) ආගමට ස්වදේශිකයන් හරවා ගැනීම හා රෝමානු කතෝලික බලය නැතිකර දැමීම.
- තම ආගම වැළඳගත් ජනයාට කියවීම, ලිවීම පිළිබඳ මූලික අධ්‍යාපනයක් ලබාදීම.
- තම දේශපාලන බලය තහවුරු කරගැනීම.
- ආගම පැතිරවීම සඳහා අවශ්‍යය දේශකයින් හා ගුරුවරුන් පුහුණු කිරීම.
- පාලනයට සහාය විය හැකි මධ්‍යම පාන්තික උගතුන් පිරිසක් පුහුණු කර ගැනීම.

අධ්‍යාපනය ලබාදීම සඳහා ලන්දේසීන් භාවිත කලේ පෘතුගීසීන් ආරම්භ කල පාසල් පද්ධතියයි. නමුත් ඔවුන් මෙම පාසල් පද්ධතිය වැඩි දියුණු කරන ලදි. අමතරව නෝමල් පාසල් නමින් ගුරුවිද්‍යාලයන් ද ඇති කරන ලදී. ලන්දේසීන්ගේ අධ්‍යාපනය ලබාදීමේ කටයුතුද පෘතුගීසීන්ගේ මෙන්ම මුහුදුබඩ ප්‍රදේශවලට හා ස්වල්ප වශයෙන් රට අභ්‍යන්තරයට (රත්නපුර, ගම්පහ ආදි ප්‍රදේශ) සිදු කරන ලදී. ඒ නිසාද මධ්‍ය කඳුකරයේ සිංහල රාජ්‍ය පාලනය තිබූ ප්‍රදේශවලට අධ්‍යාපන බලපෑම් සිදු නොවූ නිසා එය සිංහල රාජ්‍ය පැවැති ප්‍රදේශවලට සිදුවූ අධ්‍යාපනික අඩුපාඩුවක් ලෙසද සැලකිය හැකිය. හේතුව ලන්දේසී අධ්‍යාපන පද්ධතිය සාපේක්ෂව දියුණු හා සාර්ථක අධ්‍යාපන පද්ධතියක් ලෙස විවිධ සාධක ඔස්සේ සැලකිය හැකි නිසයි. උදා:- සාර්ථක පාසල් පද්ධතිය, ගුරු විද්‍යාලයක් ඇරඹීම, මුද්‍රණ ශිල්පය ඇතිවීම, රෝම ලන්දේසි නීතිය මෙරටට හඳුන්වා දීම, ක්‍රමවත් අධ්‍යාපන පරිපාලනය, පළල් විෂය මාලාව, වෘත්තීය අධ්‍යාපන ආදියයි.

මීළඟට ක්‍රි.ව. 1796 දී ඉංග්‍රීසීන් (බ්‍රිතාන්‍යයන්) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත් ලන්දේසීන්ගෙන් අත්කර ගත්හ. පසුව මොවුන්ද අල්ලාගත් ප්‍රදේශ පාලනය කරන අතරතුර අධ්‍යාපනය ලබාදීමේ කාර්යද සිදුකරන ලදී. අධ්‍යාපනය ලබාදීම සඳහා බ්‍රිතාන්‍යයන් මීට පෙර පෘතුගීසීන්ගෙන් පසුව ලන්දේසීන්ගෙන්ද පවත්වාගෙන ගිය පාසල් පද්ධතියම යොදා ගත්තේය. විශේෂයෙන්ම බහුලව පැවැති පාසල් වූ පැරිෂ් පාසල් තවදුරටත් දියුණු කරන ලදී. ක්‍රි.ව. 1812 න් පසු මොවුන් අධ්‍යාපන කටයුතු මිෂනාරි සමාගම් 5 කට පවරන ලදී. (ලන්ඩන් මිෂනාරි සමාගම, බැප්ටිස් මිෂනාරි සමාගම, වෙස්ලියන් මිෂනාරි සමාගම, ඇමරිකන් මිෂනාරි සමාගම හා චර්ච් මිෂනාරි සමාගම) පසුව ඉංග්‍රීසීන් 1815 දී ශ්‍රී ලංකාවේ උඩරට රාජධානිය අත්පත්කරගෙන මුළු ශ්‍රී ලංකාවම 1948 නිදහස ලැබෙන තෙක් පාලනය කරන ලදී.

## බ්‍රිතාන්‍ය යුගයේ ලංකාවේ අධ්‍යාපන පරමාර්ථ

- අධ්‍යාපනය ක්‍රමය මූලික වශයෙන් යටත් විජිත පාලකයන්ගේ බලය හා අවශ්‍යතා මත පදනම් කර ගනිමින් පවත්වාගෙන යාම.
- පාලන තන්ත්‍රයට අවශ්‍ය පහළ මට්ටමේ ලිපිකරුවන් භාෂා පරිවර්තනයන් වැනි උගුන් සපයා ගැනීම.
- ක්‍රිස්තියානි ආගම ස්වදේශිකයන් අතර පැතිරවීම.
- එංගලන්තයට පක්ෂපාති කුඩා ප්‍රභූ පිරිසක් ස්වදේශිකයන් අතරින් බිහිකර ගැනීම.
- පාසල ජාතික අවශ්‍යතා හා දේශීය සංස්කෘතියෙන් ඈත්කර තැබීම.
- නූතන අදහස් පැතිරවීමට අධ්‍යාපනය භාවිත කිරීම.

මෙවැනි අරමුණු/පරමාර්ථ වෙනුවෙන් ඔවුන් අධ්‍යාපනය හා අධ්‍යාපන පද්ධතිය මෙහෙය වනු ලැබීය. ඉංග්‍රීසිගේ පාලන කාලයේ මුල් අවධියේම උඩරට රාජ්‍ය බලය සම්පූර්ණයෙන් පවරාගෙන රට පාලනය කලහ. මහනුවර යුගය අවධියේ (17-18 සියවස්) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතීන් දෙකක් හඳුනාගත හැකිය.

**1. පන්සල් ආශ්‍රිත බෞද්ධ අධ්‍යාපන ක්‍රමය**

මෙය මුලින් සඳහන් කළ ආකාරයට හොඳින් පෝෂණය වූ සියවස් ගණනාවක් ශ්‍රී ලංකාවේ ස්ථාපිත වූ අධ්‍යාපන ක්‍රමයයි. මෙම අධ්‍යාපන ක්‍රමය හා අධ්‍යාපන පද්ධතිය මේ වන විට ප්‍රධාන වශයෙන් කන්ද උඩරට රාජ්‍යයට පමණක් සීමා වී ඇත. අනුරාධපුර ශිෂ්ටාචාරය පැවති කාලයේදී ඉතා විශිෂ්ඨ අධ්‍යාපන ක්‍රමයක්ව තිබී අනුරාධපුර යුගයෙන් පසුව විවිධ ඓතිහාසික හේතූන් නිසා ක්‍රමයෙන් පරිහානියට පත් විය. නමුත් කාර්යශූර උද්යෝගිමත් රජවරුන් රාජ්‍ය පාලනය කරන කාල වල තාවකාලික පුනර්ජීවයක් ලැබී තිබුණි. විශේෂයෙන් සඳහන් කළ හැක්කේ මහනුවර රජකළ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාද (ක්‍රි.ව. 1747 - ක්‍රි.ව. 1782) අධ්‍යාපන පුනර්ජීවයට ඉතා වෙහෙසක් දරා ඇත.

**2. හොඳින් සංවිධානය වූ බටහිර අධ්‍යාපන පද්ධතිය**

ක්‍රි.ව. 1796 දී බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ අල්ලා ගන්නා අවධියේ දී පැරිෂ් (මීසම්) පාසල් පද්ධතිය සාර්ථකව ක්‍රියාත්මක විය. මෙම අධ්‍යාපන පද්ධතිය පෘතුගීසි හා ලන්දේසි යුගයන්හි දී ඉහත විස්තර කළ ආකාරටය ක්‍රමයෙන් බෞද්ධ අධ්‍යාපන පද්ධතිය අභිබවා සංවර්ධනය වී රටේ ස්ථාපිත විය. ක්‍රිස්තියානි පරිසරයක් සහිත ලන්දේසීන්ගේ ප්‍රදේශවලට සීමා වූ අතර ඒවා රජය විසින් පාලනය කරන ලදී. නමුත් මහනුවර රාජධානිය තුළ ක්‍රි.ව. 1815 දී බ්‍රිතාන්‍යයන් මහනුවර රාජධානිය අත්පත් කරගන්නා තෙක් බෞද්ධ අධ්‍යාපන පද්ධතිය මහනුවර යුගයේ උඩරට රාජධානි තුළ ක්‍රියාත්මක විය.

**මෙම පාසල් අධ්‍යාපනයේ විශේෂ ලක්‍ෂණ වන්නේ,**

- පාසල් විෂය මාලාවට ඇතුළත් වූයේ කියවීම, ලිවීම හා සුළු වශයෙන් අංක ගණිතයයි.
- අනිවාර්යය අධ්‍යාපනය තිබුණි. (අවුරුදු 05 - 15 දක්වා).
- අවුරුදු 15න් පසු අර්ධ කාලීන අධ්‍යාපනයක් තිබුණි.
- පන්සල් ආශ්‍රිත පාසල් මෙන් නොව මධ්‍යගත පාලනයක් පැවැතුණි.

මේ අනුව පැහැදිලි වන්නේ මහනුවර යුගයේ අග භාගයේදී (ක්‍රි.ව.1796 - ක්‍රි.ව 1815) උඩරට රාජ්‍ය තුළ පැවැතියේ ස්වාධීන අධ්‍යාපන පද්ධතියයි. බටහිර පාසල් පද්ධතිය පෘතුග්‍රීසින්ගෙන් ආරම්භ වී ලන්දේසී යුගයේ තවදුරටත් සංවර්ධනය වී තිබුණද, උඩරට ප්‍රදේශයේ එවැනි පාසල් එකක් වත් පිහිටුවා නොතිබිණි. මෙය සුමතිපාල (1993. පිටුව.6) ක්‍රි.ව.1815 වන විට තිබූ පාසල් පිළිබඳ පහත ආකාරයට සඳහන් කරයි. "සිංහල පළාත්වල නාමික වශයෙන් නඩත්තු කරන ආණ්ඩුවේ පාසල් සංඛ්‍යාව අනූවකි. මැලබාරි දිස්ත්‍රික්කවල ඉතිරිව ඇත්තේ හුදෙක් හතරකි. කන්ද උඩරට පළාත්වල එකක් හෝ නොමැත.''

මීට අමතරව ක්‍රි.ව. 1832 ප්‍රකාශයට පත් කරන ලද කෝල්බෲක් වාර්තාව උඩරට රාජ්‍යය තුළ තිබූ ස්වදේශී අධ්‍යාපනය පිළිබඳ විස්තර කර ඇත්තේ මේ ආකාරයටයි. "දේශීය පූජ්‍ය පක්‍ෂය විසින් පන්සල්වල හා විද්‍යාලවල සපයනු ලබන අධ්‍යාපනය සඳහන් කිරීමට තරම් නොවටී"(සුමතිපාල, 1993. පිටුව 8). මේ අනුව පැහැදිලි වන්නේ ස්වදේශිය බෞද්ධ අධ්‍යාපනය පද්ධතිය අනුරාධපුර යුගයේ ඉතාමත් දියුණුවට පත්ව තිබී පසුව පොළොන්නරුව යුගයේදී හා ඉන්පසුව මහනුවර යුගය දක්වා පරිහානියට පත්වූ බවයි. ඒ සඳහා විවිධ හේතූන් බලපා ඇත. ඒ අතරින් ප්‍රධාන හේතූන් වන්නේ රටේ අස්ථාවර රාජ්‍යය පාලනය, ඉන්දියානු ආක්‍රමණ, ඒකීය රාජ්‍යය පාලනයක් නොමැතිව රටේ ප්‍රාදේශීය රජවරුන් පාලනය කිරීම, රාජධානි කීපයකට බෙදී පැවතීම, පාලන බලය සඳහා රාජ්‍යය අතර ගැටුම් ඇතිවීම ආදියයි. ස්වදේශීය අධ්‍යාපනයේ විශේෂ ලක්‍ෂණ හා එය පිරිහී යාමට බලපෑ හේතූන් පිළිබඳව කෙටියෙන් සලකා බලමු.

**ස්වදේශීය අධ්‍යාපනයේ විශේෂ ලක්‍ෂණ**

- ස්වදේශීය අධ්‍යාපන ක්‍රමය ප්‍රභූ පන්තියට නැඹුරු අධ්‍යාපනයක් වුවත් පොදු ජනතාවටද මූලික අධ්‍යාපනයක් ලබාගැනීමේ අවස්ථාව හිමි ව තිබුණි.
- අධ්‍යාපන ක්‍රමය සම්පූර්ණයෙන්ම ගුරු කේන්ද්‍රිය විය.

- ගුරුගෙදර, පන්සල් හා පාසල් අධ්‍යාපනය සතුටු දායක මට්ටමින් තිබුණි. (මේ බවට සීගිරි කුරුටු ගී වලින්ද සාක්ෂි සොයාගත හැකිය).
- සාමාන්‍ය ජනතාව තුළ සාරධර්ම ඇති කිරීම සඳහා බෞද්ධ භික්ෂූන් වහන්සේලා බණ දේශනා කිරීම, විවිධ චාරිත්‍ර හා උත්සව සංවිධානය කිරීම වැනි නොවිධිමත් අධ්‍යාපන ක්‍රම යොදා ගෙන ඇත.
- වෛද්‍ය පීඨයක්, කෘෂිකර්ම පීඨයක්, ඉංජිනේරු පීඨයක් වැනි ඉහළ මට්ටමේ අධ්‍යාපනය ලබා දෙන ආයතන තිබූ බවට පැරණි නටඹුන් වලින් හා පැරණි ග්‍රන්ථවලින් සාක්ෂි ලැබී ඇත.

**ස්වදේශීය අධ්‍යාපනය පිරිහී යාමට හේතු**

- බටහිර පාලකයන්ගේ පාසල් හා තරඟ කිරීමට ස්වදේශීය අධ්‍යාපන ආයතනවලට නොහැකි වීම.
- බටහිර අධ්‍යාපනය ලබා දුන් පාසල් ස්වදේශීය අධ්‍යාපන ආයතනවලට වඩා මැනවින් සංවිධානය වී තිබීමත්, නඩත්තුව හා පාලනය කාර්යක්ෂමව තිබීම.
- දේශීය අධ්‍යාපනයට වඩා බටහිර අධ්‍යාපනය සමාජ පැවැත්මට වඩා ඉවහල් වීම.
- පිරිවෙන්වල ආරක්ෂාව සැපයීමට සංහල රජවරුන්ට නොහැකිවීම.
- පෘතුගීසි හා ලන්සේසී දේශීය බෞද්ධ ජනතාව ක්‍රිස්තු ධර්මයට හරවා ගැනීම නිසා බෞද්ධ ජන සංඛ්‍යාව අඩු වීම.

බෞද්ධ අධ්‍යාපන පද්ධතිය මෙලෙස පිරිහීමට හේතුව වන්නේ 1505 පෘතුග්‍රීසි ආක්‍රමණය සිට මහනුවර යුගයේ අවසානය (ක්‍රි.ව. 1815) දක්වා උඩරට රාජධානිය පාලනය කළ රජවරුන්ට නිරන්තරයෙන් උඩරට රාජ්‍යය රැකගැනීමට සටන් කිරීමට සිදු වීමයි. ඒ නිසා බෞස්ධ අධ්‍යාපනය නගා සිටුවීමට උත්සාහ දැරීමට අවකාශයක් නොමැති විය. කන්ද උඩරට රාජ්‍යයේ පළමු රජු වූ සේනා සම්මත වික්‍රමබාහු රජතුමා (ක්‍රි.ව. 1499-1511) සිට අවසන් රජු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා (ක්‍රි.ව. 1798-1815) දක්වා මේ ආකාරයට රාජ්‍යය බේරා ගැනීමට සටන් කිරීමට සිදු විය.

## සමෝධානය

මෙවැනි තත්ත්වයන් තිබුණද විශේෂයෙන් මහනුවර යුගය සලකන විට දේශිය බෞද්ධ අධ්‍යාපනයෙන් පෝෂිත වූ සංස්කෘතියක්, ජන සමාජයක් බිහිවිය. ඒ තුළින් ම සමහර ක්ෂේත්‍රවල අද්විතීය නිර්මාණ බිහිවිය. ඒ කෙරෙහි සෘජුවම බලපාන්නේ එකල තිබූ බෞද්ධ අධ්‍යාපනයේ ප්‍රගතියයි. පහත සඳහන් සාක්ෂි ඔස්සේ එක් එක් ක්ෂේත්‍රවල අති විශිෂ්ඨ අධ්‍යාපනයක් තිබූ බවට තහවුරු කරගත හැකිය. මේ සඳහා මහනුවර යුගයේ ගෘහ නිර්මාණ ශිල්පය හා කලා ශිල්පය සාර්ථකව තිබූ බවට උදාහරණ ගණනාවක් සලකා බැලිය හැකිය. මෙය එකල තිබූ බෞද්ධ අධ්‍යාපනයේ යම් තරමක සාර්ථකත්වය තහවුරු කිරීමකි. දඹුල්ල, අලුවිහාරය, රිදීගම, දනගිරිගල, දෙගල්දොරුව, නීලගම ආදී ස්ථානවල ලෙන් විහාර ආශ්‍රිත චිත්‍ර හා පිළිම කර්මාන්තය, දළදා මාලිගාව, සතර මහා දේවාල, මල්වතු හා අස්ගිරි විහාරයන්, පුසුල්පිටිය, කටාරංගල ආදි රජමහා විහාරවල තිබෙන කලාත්මක චිත්‍ර හා ගොඩනැගිලි කර්මාන්තය, ගෙඩිගේ විහාරයන් මහනුවර යුගයේ කලා නිර්මාණ සඳහා දකුණු ඉන්දියානු ශිල්පීන් ද යොදාගත් බව පෙනී යයි. එයින් පැහැදිලි වන්නේ මහනුවර යුගයේ අධ්‍යාපනය වෙනත් රටවලින්ද පෝෂණය වූ බවයි. මහනුවර යුගයේ බිහි වූ විශිෂ්ඨ මෙන්ම විශේෂිත නිර්මාණයක් ලෙස, විහාරස්ථානවල ඉදිකර ඇති මකර තොරණ හඳුන්වාදිය හැකිය.

මහනුවර යුගයේ අධ්‍යාපනය සලකන විට සම්පූර්ණයෙන්ම බෞද්ධ අධ්‍යාපන පද්ධතියක් ක්‍රියාත්මක වී ඇත. බටහිර අධ්‍යාපනයමහනුවර යුගයේ අවසානයේ (ක්‍රි.ව. 1815) පසුව කන්ද උඩරටට හඳුන්වා දී පාසල් පද්ධතියක් බිහි වී එය වර්තමානය දක්වා දියුණු වී ඇත.